# තඹලගමුව ප්‍රාදේශීය සභාව
# ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 26 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව තඹලගමුව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගණකාධිකරණ අඩුපාඩු.

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාව ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමට කටයුත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් පොත් අගය මත රු.11,940,612 ක් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණ ද, මෙම වත්කම් භෞතික සමීක්ෂණයට භාජනය කර නොතිබුණි.

(ඇ) නැති වූ පුස්තකාල පොත් සඳහා අය කරන ලද රු.80,643 ක වටිනාකම ලෙජර් ගිණුම් වලින් ගැලපීම් කරනවා වෙනුවට පුස්තකාල පොත් ගිණුමට බැර කර තිබුණි.

#### 1.3.2 ගෙවියයුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,294 ක් විය.

1.3.3 බැංකු ගිණුම්

බැංකු සැසඳුම් සඳහා සිදු කරන ලද ගැලපීම්වලට අදාල තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | අවස්ථා ගණන | කාල විශ්ලේෂණ<br>වර්ෂ 01 සිට 03 ට අඩු | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| නිකුත් කරන ලද නමුත්, ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත්. | 04 | 7,793 | 7,793 |
| | 04 | 7,793 | 7,793 |

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්.

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුමට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.38,817 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.44,366 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|---|
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 ඡේදය | 1987 සිට සමාලෝචිත වර්ෂය දක්වා වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i) | 11 පරිච්ඡේදයේ 16(1) ඡේදය | චංචල හා නිශ්චල දේපළ වෙනුවෙන් ලේඛනයක් නඩත්තු කිරීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 1 පරිච්ඡේදයේ 5(xi) ඡේදය | මුදල් හා ගබඩා සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | 1 පරිච්ඡේදයේ 5(xii) ඡේදය | මුදල් හා ගබඩා භාර සිටින නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප තැන්පතුවක් ලබා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | Xii පරිච්ඡේදයේ අංක 214 ඡේදය | සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂය අවසානයේ පහත සඳහන් තොග අයිතම සමීක්ෂණයට භාවිතා කර නොතිබුණි.<br>(i.) මුද්දර<br>(ii.) ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර<br>(iii.) පරණ පුවත්පත් හා සඟරා |
| (v) | Xii පරිච්ඡේදයේ 217 වන පරිඡේදය | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත. | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය සහ 2006 ඔක්තෝබර් 12 දිනැති දේශීය ආදායම් කොමසාරිස්ගේ ලිපිය පරිදි කොන්ත්‍රාත් වැඩ සඳහා ගෙවීම්වලින් රු.38,817 ක් රඳවා ගැනීමේ බදු අඩු කර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්ථන වියදම රු.10,304,139 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්ථන වියදම රු.3,382,274 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | තථ්‍ය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,554,380 | 4,374,853 | 2,129,527 | 6,892,000 | 3,478,541 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 380,000 | 419,548 | -- | 522,500 | 288,241 |
| (iii) | වෙනත් ආදායම් | 3,551,500 | 99,943 | 3,436,556 | 2,327,700 | 7,741,458 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර, ප්‍රධාන ලේකම්, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.8,446,254 ක් වූ සභාවට ලැබියයුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමහ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත රු.000 | 2010 තථ්‍ය රු.000 | 2010 විචලනය රු.000 | 2009 අයවැයගත රු.000 | 2009 තථ්‍ය රු.000 | 2009 විචලනය රු.000 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,316 | 6,643 | 3,673 | 10,160 | 5,861 | 4,299 |
| අනෙකුත් | 7,930 | 12,684 | (4,754) | 10,227 | 7,023 | 3,204 |
| උප එකතුව | 18,246 | 19,327 | (1,081) | 20,387 | 12,884 | 7,503 |
| ප්‍රාග්ධන වියදම | 15,040 | 2,119 | 12,921 | 2,040 | 2,665 | (625) |
| මුළු එකතුව | 33,286 | 21,446 | 11,840 | 22,427 | 15,549 | 6,878 |

## 2.4 මානව සම්පත් කළමණාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 01 | -- | 01 |
| ද්විතියික | 09 | 09 | -- |
| ප්‍රාථමික | 13 | 08 | 05 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 10 | (10) |
| එකතුව | 23 | 27 | (04) |

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

විගණනයේ දි හඳුනා ගත් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | අයිතමය | අයිතම සංඛ්‍යාව | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. |
| (අ) | අයන් සර්වර් | 01 | වර්ෂ 03 කට වැඩි | හඳුනා ගත නොහැක |
| (ආ) | ෆැක්ස් යන්ත්‍රය | 01 | වර්ෂ 02 කට වැඩි | |
| (ඇ) | පරිගණක මේසය | 01 | වර්ෂ 01 කට වැඩි | |
| (ඈ) | ඡායා පිටපත් යන්ත්‍රය | 01 | වර්ෂ 02 කට වැඩි | |

2.5.2 <u>ලැබියයුතු ගිණුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.203,550 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,440 ක් විය.

2.5.3 <u>අය වීමට ඇති සේවක ණය.</u>

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,825,315 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.457,236 ක් විය.

(ආ) ස්ථාන මාරු ලැබ් ගිය සහ සේවයෙන් පහ කරන ලද නිලධාරීන්ගෙන් අය වියයුතු සේවක ණය ශේෂය රු.122,422 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5.4 <u>සමීක්ෂණය නොකළ වත්කම්.</u>

භෞතික සමීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මහින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.11,940,612 ක් විය.

2.6 <u>වාහන උපයෝජනය.</u>

දෛනික ධාවන සටහන්වල ගමන් අවශ්‍යතාවය, ධාවනය කළ දුර, ඉන්ධන ලීටරයකට ධාවනය කළ හැකි දුර ප්‍රමාණය, ආදි අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කර නොමැති අතර, මාසික ධාවන සාරාංශ ද පිළියෙළ කර නොතිබුණි.

2.7 <u>හඳුනා ගත් පාඩු හා හානි.</u>

සභාවේ පවත්වා ගෙන යන තොරතුරු අනුව, හානි හා පාඩු වටිනාකම රු.309,295 ක් බව විගණන පරීක්ෂාවේ දි නිරීක්ෂණය විය.

2.8 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගබඩා
(ඉ) ආදායම් පරිපාලනය
(ඊ) පාඩු ලේඛණය